# ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව

## ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ සත්ත්ව සංවර්ධන උපදේශක තනතුර සඳහා බඳවා ගැනීමට අයදුම්පත් කැඳවීම - 2025

ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සත්ත්ව සංවර්ධන උපදේශක III ශ්‍රේණියේ පුරප්පාඩුව පවතින තනතුරු 28 සඳහා බඳවා ගැනීමට, ඌව පළාතේ පූර්වාසන්න වසර 03 ක අඛණ්ඩ ස්ථිර පදිංචියක් ඇති පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් 2025.12.26 වන දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

| අ.අ | තනතුර, ශ්‍රේණිය සහ වැටුප් පරිමාණය | අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සහ අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස |
|---|---|---|
| 01 | ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සත්ත්ව සංවර්ධන උපදේශක - III ශ්‍රේණිය<br>**වැටුප් පරිමාණය :**<br>MN 3 - 2025 අනුව, රු. 52,250 - 10 X 800 - 11 X 1,190 - 10 X 1,320 - 10 X 1,350 - 100, 040/- රා.ප.ච. 10/2025 චක්‍රලේඛයේ උපලේඛන III අනුව 2027.01.01 දින දක්වා වැටුප් ගෙවනු ලැබේ. | **වයස** : අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 35 ට නොවැඩි විය යුතුය. රාජ්‍ය හා පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන් සම්බන්ධයෙන් උපරිම වයස් සීමාව බලනොපානු ඇත.<br>**අධ්‍යාපන සුදුසුකම්** :<br>ක්ෂේත්‍රයට අදාළව පහත සඳහන් විෂයයන් දෙකක් සහිතව විද්‍යා/ගණිතය/තාක්ෂණවේදය විෂයය ධාරාවට අයත් විෂයයන් තුනකින් අ.පො.ස (උ.පෙළ)විභාගය එකවර සමත්වීම<br>(භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, ජීව විද්‍යාව, සංයුක්ත ගණිතය, ජෛව පද්ධති තාක්ෂණවේදය, තාක්ෂණය සඳහා විද්‍යාව හා කෘෂි විද්‍යාව)<br>**සහ**<br>සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයක් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම<br>**වෘත්තීය සුදුසුකම්** :<br>තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක් විසින් පිරිනමනු ලබන ද්‍ විවුරුදු සත්ත්ව පාලන ඩිප්ලෝමාව හෝ ද්‍ විවුරුදු කෘෂිකර්ම ඩිප්ලෝමාව ලබා තිබීම<br>**හෝ**<br>රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ)06 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම<br>**හෝ**<br>උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හා ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතන වලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම. |

02. සත්ත්ව සංවර්ධන උපදේශක තනතුරට අදාළ බඳවා ගැනීමේ සුදුසුකම්, ඉල්ලුම් කළ යුතු ආකාරය, බඳවා ගැනීමේ ක්‍රමය, තරග විභාගයේ විෂයය නිර්දේශය ආදී සියලුම තොරතුරු ඇතුළත් විස්තරාත්මක නිවේදනය සහ අයදුම්පත **https://exams.psc.up.gov.lk/** වෙබ් අඩවියෙන් ලබා ගත හැකි අතර, වෙබ් අඩවියේ සඳහන් මාර්ගගත ප්‍රවේශය ඔස්සේ අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

03. සත්ත්ව සංවර්ධන උපදේශක තනතුරට අදාළ සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන්ට පමණක් උක්ත තනතුර සඳහා අයදුම් කළ හැකි අතර, නියමිත සුදුසුකම් සපුරා නොමැති හා ඉහත සඳහන් වයස් සීමාවට පරිබාහිරව ඉදිරිපත් කර ඇති, විධිමත් පරිදි ඉදිරිපත් කර නොමැති හා ප්‍රමාද වී ලැබෙන සියලුම අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. මාර්ගගතව 2025.12.26 දින ප.ව 11.59 හෝ ඊට පෙර නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත පද්ධතියට යොමු කළ (Submit) පසුව අයදුම්පතේ මෘදු පිටපත බාගත (මෙනුවෙහි Application වෙත පිවිසෙන්න) කර ගත යුතුය. බාගත කර ගන්නා ලද අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගෙන විභාගය සඳහා විභාග ගාස්තු ගෙවන ලද කුවිතාන්සිය ද නියමිත ස්ථානයේ අලවා 2026.01.02 දින හෝ ඊට පෙර ලේකම්, ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 14/4, පිළිපොතගම පාර, පිංඅරාව, බදුල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් පමණක් එවිය යුතුය. අයදුම්පත් බහාලූ ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඌව පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සත්ත්ව සංවර්ධන උපදේශක III ශ්‍රේණියට විවෘත පදනම මත බඳවා ගැනීම - 2025 පැහැදිලිව සඳහන් කළ යුතුය.

05. ඉහත තනතුර සඳහා ලැබී ඇති සුදුසුකම් සහිත අයදුම්පත් සංඛ්‍යාව, පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවට වඩා වැඩිවන්නේ නම්, විවෘත තරග විභාගයක් පවත්වා අපේක්ෂකයින් ලබා ගන්නා ඉහළම ලකුණුවල ප්‍රමුඛතාවය මත බඳවා ගැනීම් සිදු කරනු ලබන අතර, මෙම පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් සිදු කිරීම/ නොකිරීම හෝ පුරප්පාඩු සංඛ්‍යාවෙන් කොටසක් සම්පූර්ණ කිරීම හෝ මේ පිළිබඳව අවසාන තීරණය ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය. එමෙන්ම මෙම නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කිසියම් කරුණක් වෙතොත් ඒ ගැන පැහැදිලි කිරීම්/ තීරණය කිරීම ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් කරනු ඇත.

06. මේ පිළිබඳ වැඩි විස්තර කාර්යාල වේලාව තුළ ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දුරකථන අංක **0552222400, 0552231460** ඇමතීමෙන් ලබා ගත හැකිය.

**(එල්.ඒ.සෝමරත්න)**
**ලේකම්,**
**ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

**2025.12.05 වන දින.**
**ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව,**
**අංක 14/4, පිළිපොතගම පාර, පිංඅරාව, බදුල්ල.**

tamilguru.lk